2282

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## 13 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2025
## Third Term Test - Grade 13 - 2025

ජීව විද්‍යාව I
Biology I

09 S I

පැය දෙකයි
Two Hours

නම / විභාග අංකය: ........................................................................................................

- මෙම ප්‍රශ්නපත්‍රය ප්‍රශ්න 50කින් සමන්විත වේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය කතිරයක් (X) යොදා දක්වන්න.

01) ජීවීන්ට ලාක්ෂණික ලක්ෂණයකි වර්ධනය හා විකසනය, වර්ධනය පිළිබඳව නිවැරදි වන්නේ,

1. ප්‍රත්‍යාවර්ති ලෙස සිදුවන ප්‍රමාණාත්මක වැඩිවීමකි.
2. සියලුම ජීවීන් තම ජීවිත කාලය පුරාම වර්ධනය සිදු වේ.
3. කුඩා ජීවීන්ට අධික වර්ධන වේගයක් ඇත.
4. වර්ධනය ජීවීන්ටම පමණක් ලාක්ෂනික වූ ලක්ෂණයකි.
5. සියලුම ජීවීන්ගේ වර්ධනයේ පියවරක් ලෙසට සෛල විභාජනය සිදුවේ.

02) ප්‍රෝටීන් සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක්ද?

1. සංඝටක මූල ද්‍රව්‍ය ලෙස හැම විට සල්පර් අඩංගුවේ.
2. දුස්ස්වභාවීකරණයේදී සියලු බන්ධන බිඳී යයි
3. කොලැජන් ශක්තිමත් බව ලබාදෙන තෘතියික ව්‍යුහය දරණ ප්‍රෝටීනයකි
4. යාමක ප්‍රෝටීන කෘත්‍යයන් අවසන් වූ පසු සීඝ්‍රයෙන් හායනය අවශ්‍ය වේ.
5. රුධිර කැටියක ඇති ප්‍රෝටීන පයිබ්‍රිනෝජන්ය.

03) සුන්‍යෂ්ඨික සෛලයක සෛල ප්ලාස්මයේ ඇති ආශයිකා හා ඒවායේ කෘත්‍ය නිවැරදිව දක්වා ඇති ප්‍රතිචාරය කුමක්ද?

(A) ග්ලයොක්සිසෝම - ඔක්සිකරන එන්සයිම අඩංගු කර ගැනීම
(B) පෙරොක්සිසෝම - විෂහරනය
(C) ලයිසොසෝම - බහිස් සෛලිකතාව මගින් අවශේෂ ද්‍රව්‍ය සෛලයෙන් පිටතට පරිවහනය

1. A හා B 2. B හා C 3. A හා C 4. B පමණි 5. A, B හා C

04) වර්ණදේහ අටක් සහිත ද්විගුණ සෛලයක් ඌනන විභාජනය සිදු කරයි. මෙම සෛලය වර්ණදේහ සංඛ්‍යාව අඩක් දක්වා අඩුවන විභාජනයේ ආරම්භක කලාවට ඇතුල්වන විට, දැකිය හැකි DNA අනු ගණන කීයද?

1. 4 2. 2 3. 8 4. 10 5. 16

05) එන්සයිම ප්‍රතික්‍රියාවකදී

(A) එන්සයිමය වැය වේ
(B) ප්‍රතික්‍රියකය වන්නේ උපස්තරයයි
(C) එක එන්සයිම වර්ගයකට බොහෝ ප්‍රතික්‍රියා උත්ප්‍රේරනය කළ හැක
(D) සාදන ඵලවල ගුණ හා ස්වභාවය එන්සයිම මගින් වෙනස් නොකරයි
(E) ප්‍රතික්‍රියාව උත්ප්‍රේරණය සඳහා එන්සයිම විශාල ප්‍රමාණයක් අවශ්‍ය වේ.

සත්‍ය වන්නේ,

1. B C D 2. A B D 3. B හා D 4. C හා D 5. B හා E



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

06) පහත දී ඇති සංසිද්ධීන් සමග ගැලපෙන ප්‍රතිචාරය කුමක්ද?

1. ප්‍රභාශ්වසනය - සියලුම ජීවීන් තුල සිදු වේ.
2. ප්‍රභාසංශ්ලේෂණය - හරිතලව තුළදී පමණක් සිදුවන සංවෘත්තීය ක්‍රියාවකි
3. ප්‍රභාවර්තනය - සෑමවිටම ප්‍රභාසංශ්ලේෂණය ශක්තිමත් කරයි.
4. ප්‍රභා ආරක්ෂාව - අමතර ආලෝකය විසුරුවා හැරීම
5. ප්‍රභා ප්‍රතිග්‍රාහක - ෆයිටොක්‍රෝම් ප්‍රභා ප්‍රතිග්‍රාහක ආලෝකයේ තත්ත්වය පිළිබඳව ශාකයට තොරතුරු ලබා දෙයි.

07) ග්ලයිකොලිසිය සම්බන්ධව අසත්‍ය වන්නේ කවරක්ද?

(A) සියලු සෛලවල සිදු වේ.
(B) උපස්තර පොස්පොරයිලීකරණයෙන් ATP අනු 4ක් නිපදවයි
(C) $NAD^+$ අනු 2ක් NADH අනු 2ක් බවට ඔක්සිකරණය වීම
(D) එන්සයිමීය ප්‍රතික්‍රියා ශ්‍රේණියක් සහිත වීම
(E) සෑමවිටම කාබන් හයක් සහිත අණුවකින් පමණක් ආරම්භ වීම

1. A හා C පමණි 2. A, C හා E 3. B, D හා E 4. A, B, D 5. C, D හා E

08) ද්විපද නාමකරණය සම්බන්ධව අසත්‍ය වන්නේ පහත කවරක්ද?

1. ජීවියකුගේ නම පද දෙකකින් යුක්ත වීම
2. පළමුව ඇත්තේ විශේෂය අයත් ඝනයේ නමය
3. සමීප බන්ධුතා සහිත විශේෂ එකම සුලුනාමය දරයි
4. ලතින් හුරුවක් ඇති වචන වේ.
5. අත් අකුරින් ලියන විට යටින් ඉරි ඇඳිය යුතුය

09) පහත දී ඇති ලක්ෂණ දරන ජීවීන් පිළිවෙළින් දැක්වෙන ප්‍රතිචාරය කුමක්ද?

(A) අනිවාර්ය නිර්වායු ජීවියෙකි
(B) සමහර ජානවල ඉන්ට්‍රෝන (Intron) ඇත.
(C) ජවිකාවක් දරයි. මිරිදිය වාසීන්ය
(D) පොලවේ වැතිරී වැඩෙන දෙබෙදුම් ශාඛනය දරන කඳක් ඇත
(E) පටි හැඩ දේහය, පෘෂ්ඨෝදරියව පැතලිය, චූෂකර දරයි.

1. *Clostridium, Nostoc, Euglena, Pogonatum, Teania*
2. *Azotobacter, Paramecium, Euglena, Lycopodium, Planaria*
3. *Lactobacillus, Ulva, Paramecium, Cocos, Teania*
4. *Clostridium, Thermococcus, Paramecium, Selaginella, Teania*
5. *Clostridium, Methanococcus, Euglena, Lycopodium, Teania*

10)




ඉහත දී ඇති ජීවීන් සම්බන්ධව නිවැරදි වන්නේ පහත කවරක් ද?

1. සියලු සතුන් ත්‍රිප්‍රස්තරය, සීලෝමිකය, ද්විපාර්ශ්වික සමමිතිකය
2. සියලු දෙනාටම යම් ආකාරයක සැකිල්ලක් ඇත
3. මෙම සතුන් සියල්ලක්ම සංසරණ පද්ධතියක් දරයි
4. සියලු ජීවීන් සමඛණ්ඩනය දක්වයි
5. සියල්ලන්ම යම් ආකාරයක ස්නායු පද්ධතියක් දරයි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

11) දිලීර වංශ හා ඒවාට ලාක්ෂණික ලක්ෂණ පහත වගුවේ දී ඇත. එහි නිවැරදිව දක්වා ඇති සංකලන මොනවාද?

| වංශය | ලාක්ෂණික ලක්ෂණය |
|---|---|
| (A) Basidiomycota | ප්‍රමුඛ ද්වි න්‍යෂ්ටික දිලීර ජාල ඇත. |
| (B) Chytridiomycota | බහු සෛලික ආකාර පමණක් වේ. සියල්ල මෘතෝපජීවිය. |
| (C) Zygomycota | ලිංගික බීජාණු අන්තර්ජන්‍ය වේ. අලිංගික බීජාණු බහිර්ජන්‍ය වේ. |
| (D) Ascomycota | කරදිය, මිරිදිය, හෝ භෞමික වාසීන්ය. බහුතරය වියෝජකයින්ය. |

1. A පමණි 2. A හා D පමණි 3. A, B හා D 4. D පමණි 5. A හා C පමණි

12) සනාල ශාකවල ප්ලෝයම පටකයේ
1. සියලුම සෛල සජීවී වේ.
2. පත්‍ර ප්ලෝයමයේ අඩංගු සියලුම සහචර සෛල ප්ලෝයම බැර කිරීමට දායක වේ.
3. සියලුම සනාල ශාකවල පෙනේර සෛල නැත.
4. එක පෙනේර නල ඒකකයක සිට අනෙක් පෙනේර නල ඒකකයට ප්ලාස්ම බන්ධ ඔස්සේ ද්‍රව්‍ය ගලා යයි.
5. පෙනේර නාල ඒකකවල න්‍යෂ්ටිය නොමැති වුව ද අනෙක් උප සෛලීය සංඝටක ඇත.

13) ශාක පත්‍රවල පුටිකා ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ ප්‍රකාශන කිපයක් පහත දැක්වේ. අසත්‍ය වන්නේ කවරක්ද?
1. පාලක සෛලයේ හැඩය වෙනස් කරමින් පුටිකා සිදුරේ විශ්කම්භය පාලනය කරයි.
2. පුටිකා විවෘත වීමට පමණක් ජල විභව අනුක්‍රමණය වැදගත්වේ.
3. පුටිකා විවෘතවීම සක්‍රිය වේ.
4. පුටිකා විවෘතවීම හා වැසීම දෛනික රිද්මය පාලක සෛලවල අභ්‍යන්තර ඝටිකාව මගින් පාලනය කරයි
5. පාලක සෛල බාහිරාසෘතිය කළවිට, ශූනතාව අඩුවී ඇතුලු බිත්තියේ වක්‍රතාව අඩුවේ.

14) ද්‍රාව්‍ය විභවය -1.0 MPa ද, පීඩන විභවය 2MPa ද වන ශාක සෛලයක් හා ද්‍රාව්‍ය විභවය පිළිවෙලින් -0.7MPa - 1.5 MPa හා -1.0 MPa වන PQR විවෘත ජලීය ද්‍රාවණ තුනක් සපයා ඇත.
මෙම දත්ත වලට අනුව නිවැරදි වන්නේ කවරක්ද?
1. සෛලය සඳහා P ද්‍රාවණය උපරි අභිසාරික වේ.
2. සෛලය Q ද්‍රාවණයේ ගිල්වූ විට අන්තරාසෘතිය සිදුවේ
3. සෛලය P ද්‍රාවණය තුලදී සමතුලිතතාවයට පත්වූ විට සෛලයේ පීඩන විභවය 0.3MPa වේ.
4. P ද්‍රාවණය තුල සමතුලිත වූ සෛලය ආසෘත ජලයට දැමූ විට සෛලයේ පීඩන විභවය අඩුවේ.
5. මෙම සෛල R ද්‍රාවණය තුලදී බාහිරාසෘතිය කරයි

15) ශාක ජීවන චක්‍ර පිළිබඳව ලක්ෂණ කිපයක් පහත දී ඇත.
(A) විෂමබීජාණුකය, විෂමපත්‍රිකය, ජන්මානුශාක අන්වීක්ෂීය වේ.
(B) ජන්මානුශාක ද්විගෘහීය, ප්‍රභාසංශ්ලේෂකය, ස්වාධීන නොවන බීජානුශාකය
(C) පරිනත ඩිම්බ තුල ජායා ජන්මානුශාකය ඇත. අන්ඩානුධානීදරයි
(D) ද්විත්ව සංසේචනය, පරාගනය, අණ්ඩ සෛල එකක් සහිත ජායා ජන්මානුශාකය
(E) පරාගනය, කශිකාධර ශුක්‍රානු, බීජ නිපදවීම

*Cycas* ජීවන චක්‍රය හා සම්බන්ධව ගැලපෙන්නේ ඉහත කවර ප්‍රකාශ ද?
1. A, C හා E 2. A , B හා C 3. C, D හා E 4. C හා E 5. C හා D

16) බීජ ප්‍රරෝහනය හා නොගැලපෙන්නේ පහත කවරක් ද?
1. රතු හා දුර රතු ආලෝකය බීජ ප්‍රරෝහන ප්‍රතිශතය වැඩි කරයි.
2. බීජ පැලය පස මතුපිටට පැමිණි පසු නිල් ප්‍රභා ප්‍රතිග්‍රාහක මගින් බීජාධරය දික්වීම නිශේධනය කරයි.
3. බීජ විකසනය මෙන්ම බීජ ප්‍රරෝහනයද ගිබරලීන් මගින් උත්තේජනය කරයි.
4. ඇබ්සිසික් අම්ලය බීජ කලින් ප්‍රරෝහනය නිශේධනය කරයි.
5. බීජයක් ප්‍රරෝහනය වූ විගසම ගුරුත්වාවර්තනය ආරම්භ කරයි.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

17) සතුන්ගේ සමායෝජනයට දායක වන නිවැරදි ප්‍රකාශය කුමක්ද?

1. මෙහි ක්‍රියාත්මක ඒකකය හා ව්‍යුහමය ඒකකය වන්නේ නියුරෝනය
2. වැඩිපුරම ඇති සෛලවර්ගය නියුරෝනය
3. සන්ධාරණය ලබාදීම නියුරෝග්ලියා සෛල මගින් ඉටුකරන කාර්යකි.
4. නියුරෝන මිටියක් ආකාරයට සකස් වී ස්නායුවක් සාදයි
5. නියුරෝග්ලියා සෛලවලට විභාජනය වීමට හැකිය

18) සත්ව සදෘශ්‍ය පෝෂණය පිළිබඳව අසත්‍ය වන්නේ කුමක්ද?

1. ආහාරය හා පරිසරය මත පදනම්ව විවිධ සත්ව විශේෂවල විවිධ ආහාර අධිග්‍රහන ආකාර ඇත.
2. ආහාර ජීර්ණයෙන් පසුව ආහාර සැකසුම් කිරීමේ අවසන් ක්‍රියාවලි දෙක සිදු වේ.
3. සත්ව සෛල මගින් ජීරක ඵල අවශෝෂණය සක්‍රිය හා අක්‍රියව සිදු කරයි.
4. සත්ව සදෘශ්‍ය පෝෂණයේ සෑම පියවරක්ම ආහාර මාර්ග නාලය තුලම පමනක් සිදු වේ.
5. මල පහ කිරීම බහිස්‍රාවයක් ලෙස නොසලකයි.

19) සමබල ආහාරයක සංඝටකවල කාර්යයක් නොවන්නේ කුමක්ද?

1. ප්‍රෝටීන ඉතිරි කිරීම පහසු කිරීම
2. දේහ සෛල හා පටක වර්ධනය හා අලුත්වැඩියාව සඳහා භාවිතා කිරීම
3. මලවල ප්‍රමාණය වැඩි කිරීම හා ක්‍රමාකුංචන නිශේධනය කර මල බද්ධය ඇති කිරීම
4. සාමාන්‍ය සෞඛ්‍යය හා පරිවෘත්තීය පවත්වා ගැනීම
5. දේහයේ ආසෘතික තුල්‍යතාවය හා අම්ල භෂ්ම තුල්‍යතාවය පවත්වා ගැනීම

20) මිනිසකුගේ හෘදය

1. කුටීර තුනක් සහිතය
2. හෘදය මගින් පොම්ප කරන්නේ ඔක්සිජන් පෝෂිත රුධිරයයි
3. හෘදය තුල කපාට රහිතයි
4. හෘදය තුලට ඔක්සිජන් පෝෂක හා ඌන රුධිරය ගලා එයි
5. හෘදය උදරීයව පිහිටයි

21) මිනිසාගේ වසා පද්ධතිය හා රුධිර සංසරණ පද්ධතිය පිළිබඳව සංසන්දනයක් පහත දැක්වේ. එහි සත්‍ය වගන්තිය තෝරන්න.

| රුධිර සංසරණ පද්ධතිය | වසා පද්ධතිය |
|---|---|
| 1. තරලය පොම්ප කිරීමට හෘදයක් ඇත | 1. තරලය පොම්ප කිරීමට හෘදයක් ඇත |
| 2. ධමනි තුල කපාට ඇත | 2. වසා වාහිනීතුල කපාට නැත |
| 3. හෘදයෙන් පිටතට හා හෘදය දෙසට රුධිරය ගලයි | 3. හෘදය දෙසට පමණක් තරලය ගලා යයි |
| 4. අන්ධව අවසන් වූ කේශනාලිකා ඇත. | 4. දෙපසින්ම විවෘත වූ කුඩා වසා වාහිනී / වසා කේශනාලිකා ඇත. |
| 5. සංසරණ තරලයේ සංයුතිය අන්තරාල තරලයේ සංයුතියට සමානය | 5. සංසරණ තරලයේ සංයුතිය අන්තරාල තරලයේ සංයුතියට සමානය |

22) හෘත් චක්‍රයක් තුලදී සිදුවීම් කිපයක් පහත දැක්වේ. ඒ අතර ඇති ගැළපෙන යුගල් තෝරන්න.

(A) කර්ණිකා ආකුංචය - කර්ණිකා හිස්වීම.
(B) කර්ණිකා ඉහිල් වීම - තත්. 0.3 ක කාලයක් පවතී.
(C) කෝෂිකා ආකුංචය - කර්ණික කෝෂික කපාට හා අඩසඳ කපාට විවෘත වේ.
(D) පූර්ණ හෘත් විස්තාරය - අඩසඳ කපාට වැසී යාම හා කර්ණිකා කෝෂිකා කපාට විවෘත වීම.

1. A, B හා D 2. A , C හා D 3. A හා C පමණි 4. A හා D පමණි 5. A, B, C හා D




iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

23) මිනිසාගේ ශ්වසනයේ දී
1. බාහිර ශ්වසනයේදී පටල හරහා වායු හුවමාරුවක් සිදුනොවේ.
2. සාමාන්‍ය ආශ්වාසය මෙන්ම ප්‍රාශ්වාසය ද අනිච්ඡානුග බැවින් අක්‍රිය ක්‍රියාවලියක් වේ.
3. ආශ්වාසයේදී පෙනහැලිතුලට ඇතුල් කරගන්නා වාතය ශේෂ වායු පරිමාව සමග මිශ්‍රවේ.
4. ආශ්වාසයේදී ඇතුල් කරගන්නා මුලුවාත පරිමාවම ගර්තවලදී හුවමාරු වේ.
5. ශීර්ෂපෝෂී ධමනි හා මහා ධමනි බිත්තියේ ඇති සංවේදක රුධිරයේ ඉහල $CO_2$ සාන්ද්‍රණයට සංවේදී වේ.

24) මෙම ප්‍රශ්නය පහත කරුණු මත පදනම් වේ.

(A) රුධිර පීඩනය ඉහළ යාම - ධමනි බිත්ති මත LDL තැන්පත් වීම (අඩු ඝනත්ව ලිපෝප්‍රෝටීන)
(B) ඇස්බැස්ටෝසිස් - පුප්ඵුසීය අධ්‍යාතතිය
(C) අනුශ්වාසනාලිකා බිත්තිවල සිනිඳු පේශී සංකෝචනය - ඇදුම
(D) ගැස්ට්‍රයිටිස් - මානසික ආතතිය

ඉහත සඳහන් යුගලවල පළමුවැන්න සඳහා දෙවැන්න දායක වන්නේ කවර ඒවායේද?

1. A හා B 2. A හා D 3. A හා C 4. B හා D 5. B හා C

25) දී ඇති රූප සටහන සම්බන්ධව අසත්‍ය වන්නේ කුමක්ද?




1. A යනු සිදුරු සහිත කේශනාලිකා ජාලයකි
2. B තුලට එකතුවන පෙරනය රුධිර ප්ලාස්මාවේ සංයුතිය දරයි. නමුත් ප්ලාස්මා ප්‍රෝටීන නැත.
3. C හා F ස්‍රාවය මෙන්ම ප්‍රතිශෝෂණය කරයි
4. D හා E හරහා ජල ප්‍රතිශෝෂණය සිදුවේ
5. G හරහා තරල ගලන විට සාන්ද්‍ර මුත්‍රා නිපදවයි

26) සෛල මාධ්‍ය වන ප්‍රතිශක්ති ප්‍රතිචාරය හා දේහ තරල මාධ්‍ය වන ප්‍රතිශක්ති ප්‍රතිචාරයේදී සමානතාවයක් නොවන්නේ පහත කවරක්ද?
1. වසා සෛල මගින් ප්‍රතිශක්තිය ක්‍රියාත්මක කරවීම
2. ප්‍රතිදේහ ජනකයා හඳුනාගෙන උද්දීපනය වී ක්ලෝන සෑදීම
3. ආසාදක කාරකය සහිත සෛල වලට පහර දීම
4. මතක සෛල නිපදවීම
5. ප්‍රාථමික ප්‍රතිශක්ති ප්‍රතිචාර දැක්වීමට කාරක සෛල නිපදවීම

27) මිනිස් මොළයේ හෘත් සනාල මධ්‍යස්ථානය තිබෙන කොටස සම්බන්ධව සත්‍ය වන්නේ කවරක්ද?
1. දෘෂ්ටිය හා ශ්‍රවණ ප්‍රතීක සමායෝජනය
2. මස්තිෂ්ක වෘන්තයේ පහළම කොටසය
3. නින්ද හා අවදිවීමේ චක්‍ර පාලනය කරයි
4. චාලක හැකියා ඉගෙනීමට හා මතක තබාගැනීම
5. දේහ උෂ්ණත්ව යාමනය සඳහා වැදගත්වේ



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

28) ශ්‍රවණය සඳහා පීඩන තරංග හා ස්නායු ආවේග ගමන් කරන නිවැරදි මාර්ගය තෝරාගන්න.

1. බාහිර ශ්‍රවණ නාලය ⟶ කර්ණ පටහ පටලය ⟶ මුද්ගරිකාව ⟶ නිශාතිය ⟶ ධරණකය ගෝලාකාර ගවාක්ෂය ⟶ අලින්දනාලය පරිවසා ⟶ කර්ණශංඛ ප්‍රනාලය අන්තෝවසා ⟶ ශ්‍රවණ ස්නායුව ⟶ ශංඛක ඛණ්ඩිකාව

2. බාහිර ශ්‍රවණ නාලය ⟶ කර්ණ පටහ පටලය ⟶ මුද්ගරිකාව ⟶ නිශාතිය ⟶ ධරණකය ⟶ අණ්ඩාකාර ගවාක්ෂය ⟶ අලින්දනාලය පරිවසා ⟶ කර්ණශංඛ ප්‍රනාල අන්තෝවසා ⟶ කෝර්ටි අවයවය ⟶ ශ්‍රවණ ස්නායුව ⟶ ශංඛක ඛණ්ඩිකාව

3. බාහිර ශ්‍රවණ නාලය ⟶ මුද්ගරිකාව ⟶ නිශාතිය ⟶ ධරණකය ⟶ ගෝලාකාර ගවාක්ෂය ⟶ අලින්දනාලය පරිවසා ⟶ කර්ණශංඛ ප්‍රනාල අන්තෝවසා ⟶ කෝර්ටි අවයවය ⟶ ශංඛක ඛණ්ඩිකාව

4. බාහිර ශ්‍රවණ නාලය ⟶ කර්ණ පටහ පටලය ⟶ ධරණකය ⟶ අණ්ඩාකාර ගවාක්ෂය ⟶ කර්ණශංඛ ප්‍රනාල අන්තෝවසා ⟶ කෝර්ටි අවයවය ⟶ ශ්‍රවණ ස්නායුව ⟶ ලලාට කණ්ඩිකාව

5. කර්ණ පටහ පටලය ⟶ මුද්ගරිකාව ⟶ ධරණකය ⟶ කර්ණ පටහ නාල පරිවසා ⟶ කෝර්ටි අවයවය ⟶ ශ්‍රවණ ස්නායුව ⟶ ශංඛක ඛණ්ඩිකාව

29) ස්ත්‍රියකගේ ඩිම්බයක් සංසේචනයේ සිට අධිරෝපණය දක්වා සිදුවීම් ශ්‍රේණියක් පහත දැක්වේ. ඒවා අනුපිළිවෙලින් සකසා ඇති ප්‍රතිචාරය කුමක්ද?

(A) ඝන බෝලයක් ලෙස මොරුලාව සෑදීම
(B) සංසේචනය සිදුවී පැය 24කට පසුව යුක්තානුව බෙදීම ඇරඹීම
(C) බ්ලාස්ට කෝෂ්ඨය එන්ඩොමෙට්‍රියමට සවිවීම
(D) භේදනය වන යුක්තානුව ඩිම්බ ප්‍රනාලය දිගේ ගර්භාෂය දෙසට රැගෙන යාම
(E) බ්ලාස්ට කෝෂ්ඨය විකසනය වීම

1. B ⟶ D ⟶ A ⟶ E ⟶ C
2. B ⟶ A ⟶ D ⟶ C ⟶ E
3. B ⟶ A ⟶ D ⟶ E ⟶ C
4. B ⟶ D ⟶ C ⟶ E ⟶ A
5. B ⟶ C ⟶ D ⟶ A ⟶ E

30) ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝගයකදී පෙන්වන රෝග ලක්ෂණයක් පහතින් දක්වා ඇත.
"කාන්තාවන්ගේ පැලෝපීය නාලය සැරව වලින් පිරීම" මෙම රෝගය

1. *Treponema pallidum* බැක්ටීරියාව මගින් ඇතිකරයි
2. වයිරසයක් නිසා ඇතිවන රෝග තත්ත්වයකි.
3. ඉහත රෝග ලක්ෂණවලට අමතරව ලිංග ප්‍රදේශ වටා වේදනාකාරී කැසිල්ලක් ඇති කරවයි.
4. මෙම රෝග තත්ත්වය වඳ භාවයට හේතු විය හැක.
5. වසා පද්ධතියේ පිළිකා තත්ත්ව ඇති කල හැක.

31) මිනිසාගේ ගාත්‍රා සැකිල්ල සම්බන්ධව නිවැරදි වන්නේ,

1. ගාත්‍රා සැකිල්ල දිග අස්ථිවලින් පමණක් සමන්විතය
2. මෙම සැකිල්ලේ සියලුම අස්ථි සිරස් තලයේ පිහිටයි
3. ශ්‍රෝණි අස්ථි දෙක පමණක් සන්ධානය වීමෙන් මානව ශ්‍රෝණිය සාදයි
4. යට බාහුවේ වඩාත් පාර්ශ්විකව ඇත්තේ අන්වරාස්ථියයි
5. උත්කුබ්ජනයේදී අරාස්ථිය හා අන්වරාස්ථිය එකිනෙකට සමාන්තර පිහිටීමක පවතී.

32) විලිබිත පේශි සංකෝචනය පිළිබඳව පිළිගත නොහැක්කේ කුමක්ද?

1. සර්පන සූත්‍රිකා වාදය මගින් විස්තර කරයි
2. සෑම සාකොමියරයකම ඝන හා සිහින් සූත්‍රිකා එක මත එක ලිස්සායයි.
3. සාකොමියරය කෙටි වන විට එහි ඇති සූත්‍රිකා කාණ්ඩ දෙකම කෙටි වේ
4. මයොසින් හිසට ATP අණුවක් බැඳුනු විට හිස ඇක්ටින් බන්ධන ස්ථාන වලින් නිදහස් වේ.
5. මයොසින් හිස ඇක්ටින් බන්ධන ස්ථානයට බැඳීමට එම බන්ධන ස්ථාන නිරාවරනය කිරීමට $Ca^{2+}$ (කැල්සියම්) අයන වැදගත් ය.



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers · Model Answers · Study Resources

33) ජීවී ගහනයක යම් ලක්ෂණයකට අදාලව පහත දක්වා ඇති ආකාරයේ රූපානුදර්ශ ව්‍යාප්තියක් පෙන්වයි. මේ සම්බන්ධව ඉදිරිපත් කරන ලද ප්‍රකාශන කීපයක් පහත වේ. ඒ අතර සත්‍ය වන්නේ,




1. මෙම ගති ලක්ෂණය මෙන්ඩලීය ප්‍රවේණිය අනුගමනය කරයි
2. රූපානුදර්ශය සඳහා ඇලීල දෙකකට වඩා වැඩි සංඛ්‍යාවක් දායකවේ.
3. ජාන දෙකක් හෝ වැඩි ගණනක සමුච්ත ප්‍රකාශනයකි. ගති ලක්ෂණ ප්‍රමාණාත්මක වේ.
4. මානව ගහනයක නලලේ කේශ රේඛාව මෙවැනි ව්‍යාප්තියක් පෙන්වයි.
5. කුකුලන්ගේ පිහාටුවල වර්ණය ආවේණි ගත වීම මෙම ආකාර ආවේණියක් ක්‍රියාත්මක වේ.

34) එකිනෙකට ස්වාධීනව වියුක්ත වන ප්‍රවේණි ලක්ෂණ හතරක ප්‍රමුඛ ඇලීල A, B, C, D වේ. ඒවාට a, b, c, d නිලීන ඇලීල ද පවතී. මෙම ගති ලක්ෂණ හතරටම විෂම යුග්මක ශාකයක් AaBBccDd ශාකය සමග මුහුම් කල විට AABbCcDd ලැබීමේ සම්භාවිතාව,

1. 4/64  2. 2/256  3. 2/64  4. 1/256  5. 1/64

35) DNA ප්‍රතිවලිතයේදී ඇතිවන පෙරටු දාමය හා ප්‍රමාදී දාමය පිළිබඳව නොගැලපෙන්නේ,

1. පෙරටු දාමය සන්තතික දාමයකි. ප්‍රමාදිදාමය අසන්තතික වේ.
2. පෙරටු දාමයේදී RNA මූලික එකක් පමණක් දායක වේ. ප්‍රමාදිදාමයේ RNA මූලික වැඩි ගණනක් දායක වේ.
3. පෙරටු දාමයේදීත් ප්‍රමාදි දාමයේදීත් පොස්පො ඩයිඑස්ටර් බන්ධන සෑදේ
4. දාම දෙකම 5' ⟶ 3' දිශාවට ප්‍රතිවලිත දෙබල දෙසට සෑදේ
5. බහිෂ් නියුක්ලියෙස් එන්සයිමයේ ක්‍රියාව අවශ්‍ය විය හැක.

36) විකෘති පිළිබඳව අසත්‍ය වන්නේ,

1. ජාන විකෘති කුඩා පරිමාන විකෘතිය
2. නිවේෂණය හා ලෝපය සෑම විටම ලක්ෂ විකෘති නොවිය හැක.
3. සෑම විටම විකෘතියක් දෘශ්‍ය නොවිය හැක
4. දෑකැති සෛල රක්ත හීනතාව ජාන විකෘතියකි. විකෘතියට ලක්වූ ඇලීලය සහ ප්‍රමුඛය
5. සෛලයක් තුල වර්ණදේහ එකක් වැඩිපුර තිබීම බහු ගුණකතාවයයි. එය වර්ණදේහ විකෘතියකි.

37) පහත ප්‍රකාශන අතරින් නිවැරදි වන්නේ කවරක්ද?

1. ආර්ටික් තුන්ද්‍රාවල වාර්ෂික වර්ෂාපතනය ඇල්පයින් තුන්ද්‍රාවල වාර්ෂික වර්ෂාපතනය ට වඩා වැඩිය.
2. පරිසර පද්ධතියක ශක්ති ගලනය හා ද්‍රව්‍ය ගලනය ඒක දිශාත්මකය.
3. රැම්සාර් සම්මුතියට අනුව තෙත් බිමක බාදිය අවස්ථාවේදී ගැඹුර මීටර් හයක් නොඉක්මවිය යුතුය.
4. ජෛව විවිධත්වයට ජීවීන් විශේෂ සංඛ්‍යව හා පරිසර පද්ධති විවිධත්වය පමණක් අයත් වේ.
5. කොරල් පර මුහුදේ වැසි වනාන්තර ලෙස සළකන්නේ එහි වාසය කරන ජීවීන්ගේ විවිධත්වය නිසාය.

38) ජෛව විවිධත්වය සංරක්ෂණය පිළිබඳව ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

(A) ප්‍රධාන අරමුණ සියලුම ජීවී විශේෂ වල දිගු කාලීන පැවැත්මයි.
(B) ස්ථානිය සංරක්ෂණයකදී විශාල ජීවිගහනයක් ස්ථාපනය කළ යුතුය.
(C) ජීවී විශේෂය නොනැසී පැවතීම හා ප්‍රජනනය තහවුරු කිරීම විතැන් සංරක්ෂණයේදී සිදු කරයි.
(D) මින්නේරිය ජාතික වනෝද්‍යානය විතැන් සංරක්ෂණයකි.
(E) විතැන් සංරක්ෂණයේදී උචිත හා ප්‍රමාණවත් වාසස්ථාන සපයා දිය යුතුය.

මේ ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

1. A, D හා E  2. A, B හා D  3. B හා C පමණි  4. A, C හා E  5. B හා D පමණි



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

39) ක්ෂුද්‍ර ජීවී ක්‍රියාවන් සම්බන්ධව අසත්‍ය වන්නේ පහත කවරක්ද?
   1. පල් කිරීම - ශාක ද්‍රව්‍යයක කෙඳි ලිහිල් කිරීම
   2. ජෛව ප්‍රතිකර්මනය - පරිසර දූෂකවලින් සිදුවන හානි ඉවත්කිරීම පමණක් සිදුවේ
   3. නයිට්‍රීකරනය - ඇමෝනියම් අයන වල ඇති නයිට්‍රජන් නයිට්‍රේට් නිපදවීමට ඔක්සිකරණය
   4. ආහාර ආසාදනය - නරක් වූ ආහාර පරිභෝජනය කළ විට පුද්ගලයාගේ දේහය තුලට ක්ෂුද්‍ර ජීවීන් ඇතුල්වීම
   5. ක්ෂුද්‍ර ජීවී ක්ෂීරණය - ලෝපස් වලින් සමහර ලෝහ නිස්සාරණය

40) ශ්‍රී ලංකාවේ මල් වගා ක්ෂේත්‍රයේදී විවිධ වර්ධක ප්‍රචාරණ ක්‍රම භාවිතා කරයි. ඒ සඳහා නොගැලපෙන ප්‍රතිචාරය කුමක්ද?
   1. වෙන්කිරීම හා බෙදීම සිදු කරන විට ආරෝහක යොදාගනී
   2. කැපූ කැබලි භාවිතය ක්ලෝන ප්‍රතිජනන ක්‍රම අතර ඉතා වැදගත් ක්‍රමයකි
   3. *Sensavaria* පත්‍ර කැබලි මගින් ප්‍රචාරය කළ හැකිය
   4. ඕකිඩ් ප්‍රචාරනයේදී බද්ධය යොදාගත හැකිය
   5. *Hibiscus* සඳහා අතු බැඳීම කළ හැකිය.

41 සිට 50 දක්වා ප්‍රශ්න සඳහා

| | |
|---|---|
| ABD නිවැරදි නම් | 1 |
| ACD නිවැරදි නම් | 2 |
| AB පමණක් නිවැරදි නම් | 3 |
| CD පමණක් නිවැරදි නම් | 4 |
| වෙනත් ප්‍රතිචර සංකලන නිවැරදි නම් 5 | |

41) සෛලීය පරිවෘත්තියේදී පහත සඳහන් කවර ක්‍රියාවලියට/ක්‍රියාවලින්ට GTP/ATP ලෙස ශක්තිය අවශ්‍යවේද?
   A ප්‍රභාසංශ්ලේෂණ කෙල්වින් චක්‍රය
   B ග්ලයිකොලිසිය
   C ස්වායු ශ්වසනයේ ඉලෙක්ට්‍රෝන පරිවහන දාමයට
   D පොලිපෙප්ටයිඩ සංශ්ලේෂණයේ පරිවර්තනයට
   E ප්‍රභා සංශ්ලේෂණයේ ආලෝක ප්‍රතික්‍රියාවට

42) A ත්‍රිප්‍රස්තරය, සීලෝමිකය, රේත්‍රිකාවක් දරයි
   B මෙවුල, අංශපාදිකා, දැඩිකෙඳි සහිතය
   C ඛණ්ඩනය රහිතය, හෘද රහිත සංවෘත සංසරණ පද්ධතියක් ඇත
   D ඒකලිංගිකය, බාහිර සංසේචනය පෙන්වයි, කීටයා ද්විපාර්ශ්වික සමමිතිකය
   E අන්තඃසැකිල්ලක් ඇත, තුනී අපිචර්මයකින් ආවරණය වේ, ශීර්ෂණය නොදරයි

   ඉහත සඳහන් ලක්ෂණ අතරින් Echinodermata වංශයේ දැකිය හැක්කේ කවරක්/කවර ඒවාද?

43) රසෝද්ගමනය පිළිබඳව සත්‍ය වන්නේ
   A ධන පීඩන අනුක්‍රමණයක් ඔස්සේ ක්‍රියාත්මක වේ
   B සෛලම යුෂය ඉහළ නැගීමට ශාකයේ ශක්තිය වැයකෙරේ
   C උත්ස්වේදන චූෂණය අඛණ්ඩ ජල කඳ ඔස්සේ මුල් දක්වා පහලට විහිදේ
   D පාංශු ද්‍රාවණය හා වායුගෝලය අතර ශාක දේහය තුළින් ජල විභව අනුක්‍රමණය ඇති වේ.
   E සෛලම යුෂය විසරණය මගින් සිම්ප්ලාස්ටය ඔස්සේ ඉහලට ඇද ගනී.

44) පහත දී ඇත්තේ මිනිසාගේ හෝර්මෝන හා ඒවායේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ සටහනකි. ඒ අතර ඇති නොගැලපෙන ප්‍රතිචාර මොනවාද?

| | හෝර්මෝනය | ක්‍රියාව |
|---|---|---|
| A | GHRIH | TSH ස්‍රාවය නිශේධනය |
| B | ප්‍රොලැක්ටින් | කිරි නිපදවීම උත්තේජනය |
| C | කෝර්ටිසෝල් | ග්ලයිකෝජන්, ග්ලූකෝස් බවට බිඳහෙලීම උත්තේජනය |
| D | ප්‍රොජෙස්ටෙරෝන් | පීතදේහය පවත්වා ගැනීම |
| E | ඉන්හිබින් | FSH ස්‍රාවය නිශේධනය |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

45) මිනිස් සම පිළිබඳව අසත්‍ය වන්නේ,
A ස්නේහස්‍රාවි ග්‍රන්ථි මගින් විටමින් D නිපදවයි
B චර්මයේ ගැඹුරින්ම ඇති ස්තරය ජනක ස්තරයයි
C පරිසර උෂ්ණත්වය වැඩිවූවිට හමේ පර්යන්ත කේශනාලිකා විස්තාරණය වේ
D කොරෝ ස්තරය මගින් UV කිරන වලින් ආරක්ෂා කරයි.
E මිස්නර් දේහානු සියුම් පීඩන වලට සංවේදීය

46) DNA ඇඟිලි සලකුණු තාක්ෂණය පිළිබඳව සත්‍ය වන්නේ
A අධිකරණ වෛද්‍ය විද්‍යාවේදී භාවිතා කරයි
B මීට පදනම් වී ඇත්තේ පුද්ගලයන් තුල ඇති ප්‍රවේණි විවිධත්වයයි.
C වර්තමානයේදී යොදා ගන්නේ සලකුණු කරන ලද සලකුණක් භාවිතා කර විශිෂ්ඨ අනුක්‍රම ඡෂණය කිරීමයි
D ගෙනෝමය තුල ඇති ලාක්ෂණික කුඩා සමපාටික පිලියුම්/STR විශාල සංඛ්‍යාවක් තිබීම වාසියකි.
E පුනරාවර්ති ඒකක නම් ජාන සහිත DNA අනුවේ පවතින නියුක්ලියෝටයිඩ අනුපිළිවෙළක් මෙහිදී සලකා බලයි.

47) ගෝලීය පාරිසරික ගැටලු හා ඒවාට බලපාන හේතුවක් නිවැරදිව දැක්වෙන්නේ,
A කාන්තාර කරනය - දුර්වල භූමි කළමනාකරණය
B ඔසෝන් ක්ෂයවීම - මීතේන් වායුව
C ගෝලීය උණුසුම වැඩිවීම - පහල වායුගෝලයේ කලු කාබන්
D අම්ලවැසි - පොසිල ඉන්දන දහනය මගින් නයිට්‍රජන් වල ඔක්සයිඩ ලැබීම
E ගෝලීය උණුසම හා දේශගුණික විපර්යාස - කෘෂි රසායනික නිෂ්පාදන අධික භාවිතය

48) ක්ෂුද්‍ර ජීවී වගාවක් පිළියෙල කිරීමේදී අවශ්‍යතා හා අනුගමනය කරන ක්‍රියාමාර්ග පිළිබඳව නිවැරදි වන්නේ,
A රෝපණ මාධ්‍ය තුල අවශ්‍ය පෝෂක, ප්‍රමාණවත් තෙතමනය හා උචිත pH අගය අවශ්‍ය වේ.
B දිලීර වගා කිරීමට යොදා ගන්නා මාධ්‍යයට සෝඩියම් ක්ලෝරයිඩ් එක් කළ යුතුය
C රෝපන බඳුන් විවෘත දැල්ලට අල්ලා ජීවානුහරණය කරයි
D ඝන රෝපන මාධ්‍යයක් සාදාගන්නා විට ඝනීකාරකයක් ලෙස ඒගාර් යොදා ගනී
E බැක්ටීරියා වගාවක් පිලියෙල කිරීමට සුදුසු පෝෂ්‍ය ඒගාර් මාධ්‍ය වේ.

49) අනුපූරක DNA පුස්තකාලයක් සාදා ගැනීමට අවශ්‍ය එන්සයිම වන්නේ,
A රිවර්ස් ට්‍රාන්ස් ක්‍රිප්ටේස්
B DNA පොලිමරේස්
C හෙලිකේස්
D සීමා එන්ඩොනියුක්ලියේස් / Restriction Endoneuclease
E ප්‍රයිමේස්

50) මූලික සෛල වල භාවිතයන් වන්නේ,
A ලියුකේමියා රෝගීන්ගේ ඇට මිදුළු ප්‍රතිපූර්ණයට
B හානි වූ හෘද පේශි පිළිසකර කිරීමට
C AIDS වැනි රෝග සඳහා ප්‍රතිකාර කිරීමට
D සුසුම්නා ස්නායු පිළිසකර කිරීමට
E නියුමෝනියාව සඳහා ප්‍රතිකාර කිරීමට



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**13 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2025**
**Third Term Test - Grade 13 - 2025**

09 | S | II

| | | |
|---|---|---|
| ජීව විද්‍යාව II<br>Biology II | පැය තුනයි<br>Three Hours | අමතර කියවීම් කාලය - මි. 10 යි<br>Additional Reading Time - 10 minutes |

නම / විභාග අංකය: ..........................................................................

A කොටස - ව්‍යුහගත රචනා
ඒ සඳහා දී ඇති අවකාශය පමණක් භාවිතා කරන්න.
B කොටස - රචනා
තෝරාගත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. නියමිත කාලය අවසානයේ A කොටස හා B කොටස පරීක්ෂකවරයාට බාර දෙන්න

## A කොටස

01) (A) I. (a) වර්තමානයේදී ජීව විද්‍යා දැනුම නීතිමය ගැටළු විසඳීමට භාවිතා කරයි. එවැනි අවස්ථාවක් සඳහා සුදුසු උදාහරණයක් ලියන්න

..........................................................................

(b) ඔබ ඉහත සඳහන් කල අවස්ථාව සඳහා යොදා ගන්නා ජෛව තාක්ෂණික ශිල්ප ක්‍රමය කුමක්ද?

..........................................................................

II. (a) භෂ්ම යුගලන නීතිය මගින් ප්‍රකාශ කරන්නේ කවරක්ද?

..........................................................................

..........................................................................

(b) ඉහත නීතියට අනුව DNA හා RNA අතර පවතින වෙනස්කමක් සඳහන් කරන්න.

..........................................................................

..........................................................................

III. සියලුම සජීවී සෛලවල සයිටසොලයේ අවලම්බිතව ඇති න්‍යෂ්ටික අම්ල පවතින පටල රහිත උප සෛලීය ව්‍යුහයක් නම්කර කෘත්‍ය ලියන්න.

උප සෛලීය ව්‍යුහය ..........................................................................

කෘත්‍යය ..........................................................................

IV. ඉහත (III) හි ඔබ සඳහන් කළ උප සෛලීය ව්‍යුහය මගින් කරන කෘත්‍ය ආරම්භ කිරීම සඳහා ආරම්භක සංකීර්ණය සකසා ගන්නේ කෙසේද?

..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

V. (a) සුන්‍යෂ්ටික ස්‍රාවී සෛලවල සෛල ප්ලාස්මයේ බහුලවම පවතින ඉන්ද්‍රියිකාව කුමක්ද?

..........................................................................

(b) සුන්‍යෂ්ටික සෛලවල සෛල ප්ලාස්මයට සන්ධාරණය සපයන උප සෛලීය ව්‍යුහය කුමක්ද?

..........................................................................



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(c) ඔබ ඉහත සඳහන්කල උපසෛලීය ව්‍යුහය සෑදී ඇති ද්‍රව්‍ය සංගටක මොනවාද? එම සෛලීය ව්‍යුහයේ විශේෂ ලක්‍ෂණය ලියන්න

ප්‍රධාන සංගඨක ..........

විශේෂ ලක්‍ෂණය ..........

(B) I. ක්‍රොමැටින් යනු මොනවාද හඳුන්වන්න

..........

..........

..........

II. සෛල චක්‍රයේදී ක්‍රොමැටින් ඝනවීම හා ඝනවීම අඩුවන/ලිහිල්වන අවස්ථාවක් බැගින් ලියන්න.

ඝනවීම සිදුවන අවස්ථාව ..........

ඝනවීම අඩුවන /ලිහිල් වන අවස්ථාව ..........

III. (a) නිරුපද්‍රව අර්බුදයක් යනුවෙන් හඳුන්වන්නේ කවරක්ද?

..........

..........

(b) පුද්ගලයකු තුල අර්බුදයක්/ගැටිත්තක් හට ගැනීමේ ආරම්භය කුමක් ද? සඳහන් කරන්න.

..........

..........

IV. (a) ATP සචල අණුවක් වීමේ වැදගත්කම කුමක්ද?

..........

..........

(b) ජීවී සෛල තුලදී ATP වල ශක්තිය විවිධ ශක්ති ආකාර බවට පරිණාමනය වේ. පහත සඳහන් ශක්ති ආකාර යොදා ගන්නා අවස්ථාවක් බැගින් ලියන්න.

| ශක්ති ආකාරය | භාවිතා වන අවස්ථාව |
|---|---|
| ආලෝකය | .......... |
| යාන්ත්‍රික ශක්තිය | .......... |

V. (a) ප්‍රභාසංශ්ලේෂණයේ ක්‍රියා වර්ණාවලිය හඳුන්වන්න.

..........

..........

(b) ක්‍රියා වර්ණාවලියට අනුව ඔබට ඉදිරිපත් කළ හැකි නිගමනයක් ලියන්න.

..........

..........

..........

..........



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(C) I. (a) $C_3$ ශාකවල ආලෝකය ඇතිවිට හරිතලවය තුල සිදුවන හානිදායක ප්‍රතික්‍රියාව කුමක්ද?

..........................................................................................................................................

(b) ඉහත C.I(a) හි සිදුවීම නිසා $C_3$ ශාකවලට ඇති අවාසිය කුමක්ද?

..........................................................................................................................................

..........................................................................................................................................

II. එන්සයිමවල ප්‍රතික්‍රියා යාන්ත්‍රණය පැහැදිලි කිරීමට ඉදිරිපත් කර ඇති ප්‍රේරිත සීහුම (Induced Fit) යන්ත්‍රණය මගින් තහවුරු කරන්නේ කවරක්ද?

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

III. (a) ස්වසන ලබ්දියේ අගය 0.8 ක් වන ස්වසන උපස්තරයක් ස්වායු ස්වසන චක්‍රයට යොමුවන්නේ කෙසේද?

..........................................................................................................................................

..........................................................................................................................................

(b) පහත එක් එක් පරීක්ෂා කිරීමේදී ඔබ විද්‍යාගාරයේදී භාවිතා කල උපකරන/නිදර්ශක මොනවාද?

ප්‍රභාසංශ්ලේෂණ සීඝ්‍රතාව ..........................................................................................

ස්වසන සීඝ්‍රතාව/ස්වසන ලබ්ධිය ..........................................................................................

ඌනන විභාජන අවස්ථා නිරීක්ෂණය ..........................................................................................

IV. (a) පරිචිත ලක්ෂණ සම්ප්‍රේෂණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

..........................................................................................................................................

..........................................................................................................................................

(b) තක්සෝනයක් යනු කුමක්ද? හඳුන්වන්න.

..........................................................................................................................................

V. (a) විශේෂයක් සඳහා රූප විද්‍යාත්මක සංකල්පය කුමක්ද?

..........................................................................................................................................

..........................................................................................................................................

(b) සමහර ආකියාවන් (Archea) මධ්‍යකාමී පරිසර වල ජීවත් වේ. ඒ සඳහා උදාහරණයක් ලියන්න. ඔබ දැක්වූ එම ආකියා ජීවියා යොදාගන්නා ජෛව තාක්ෂණික භාවිතයක් ලියන්න.

Archea ජීවියා ..........................................................................................

භාවිතය ..........................................................................................



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

02) (A) I. (a) ද්විපද නාමකරණයට අනුව ජීවියකු නම් කිරීම සඳහා නාමයන් /කොටස් දෙකක් භාවිතා කරයි. එම කොටස් දෙක සඳහන් කරන්න.

........................................ ........................................

(b) ප්ලාන්ටේ රාජධානියේ සාමාජිකයන් පරිණාමය වූයේ හරිත ඇල්ගී කාණ්ඩයකින් බව විශ්වාස කරයි. නමුත් ප්ලාන්ටේ ශාකවල ඇති ප්‍රධාන ලක්ෂණ හරිත ඇල්ගී නොදරයි.
එම ප්‍රධාන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

................................................................................

................................................................................

................................................................................

II. *Gelidium* හා *Sargassum* අතර දැකිය හැකි වෙනස්කම් තුනක් සඳහන් කරන්න.

................................................................................

................................................................................

................................................................................

III. අපිශාකී ලෙස වැඩෙන බීජ නොසාදන සනාල ශාක දරන වංශයක් නම් කරන්න.

................................................................................

IV. (a) බීජ ශාකවල ශුක්‍රාණු වලට චල භාවයක් අවශ්‍ය නොවන්නේ ඇයි.

................................................................................

(b) බීජ ශාකවල කශිකා නොදරන ශුක්‍රාණු සහිත ශාක කාණ්ඩ මොනවාද?

................................................................................

V. ඇන්තොෆයිටා වංශය සතු ආවේණික ලක්ෂණ හතරක් ලියා දක්වන්න

................................................................................

................................................................................

................................................................................

................................................................................

(B) I. (a) මූලාග්‍රස්ථ විභාජකයෙන් පිටතට නිපදවනු ලබන සෛල විභේදනය වී සාදන ව්‍යුහය නම් කරන්න.

................................................................................

(b) මූලාග්‍රයක ගුරුත්වාවර්ති චලන සඳහා වැදගත් වන ශාක වර්ධක ද්‍රව්‍ය කුමක්ද?

................................................................................

(C) ඉහත I. (b) හි සඳහන් කළ ආවරණය දැක්වීමේදී ඔබ සඳහන් කළ වර්ධක ද්‍රව්‍යයේ කාර්ය භාරය සඳහන් කරන්න.

................................................................................

................................................................................

................................................................................

................................................................................

................................................................................



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

II. සනාල ශාක වල ප්ලෝයම දරන පහත අනුවර්තන මගින් එම ශාක වලට ලැබී ඇති ප්‍රයෝජනයක් සඳහන් කරන්න.

1. සෛලගත ද්‍රව්‍ය නැතිවීම ..........

2. හරස් බිත්ති මත පෙනේර තලයක් පිහිටීම ..........

III. (a) කාෂ්ඨීය ශාක වල දක්නට ලැබෙන පාර්ශ්වික විභාජක ආකාර දෙක සඳහන් කරන්න.

..........

..........

(b) පරිචර්මය යනු කුමක්ද?

..........

..........

IV. ඒක බීජ පත්‍රී හා ද්විබීජ පත්‍රී පත්‍රවල නාරටි වින්‍යාසය සැකසී ඇති අන්දම සඳහන් කරන්න.

ඒක බීජ පත්‍රී පත්‍ර ..........

ද්වි බීජ පත්‍රී පත්‍ර ..........

V. ජල විභව සංකල්පය හඳුන්වන්න

..........

..........

(C) I. (a) ඇතැම් අකාෂ්ඨීය ශාකවල පත්‍ර දාරයෙන් හෝ පත්‍ර තුඩුවලින් ජලය බැහැර වන ක්‍රියාවලිය කුමක්ද?

..........

(b) එම ක්‍රියාවලිය සිදුවන ආකාෂ්ඨීය ශාකයක විද්‍යාත්මක නාමය ලියන්න

..........

II. පහත මූලද්‍රව්‍ය ශාක වලට අවශෝෂණය කරගන්නා ආකාරය හා කෘත්‍ය සඳහන් කරන්න.

| මූල ද්‍රව්‍ය | අවශෝෂණය කරනු ලබන ආකාරය | කෘත්‍ය |
|---|---|---|
| P | .......... | .......... |
| | .......... | .......... |
| N | .......... | .......... |
| | .......... | .......... |

III. ලපටි පත්‍ර කුණ්ඩලාකාර ප්‍රාක් පත්‍රනය පෙන්වන ශාක සන දෙකක් නම් කරන්න.

..........

..........

IV. සපුෂ්ප ශාකයක ඡායා ජන්මාණු ශාකයේ ඇති සෛල වර්ග නම් කරන්න.

..........



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

V. (a) පරපරාගනයේ වැදගත්කමක් සඳහන් කරන්න.

.............................................................................................................

.............................................................................................................

(b) බීජ ප්‍රරෝහනයේදී බීජයක් තුල සිදුවන ක්‍රියාවලි දෙකක් ලියන්න.

.............................................................................................................

.............................................................................................................

03) (A) I. (a) අත්‍යවශ්‍ය නොවන ඇමයිනෝ අම්ල යනු මොනවාද?

.............................................................................................................

(b) ඉහත 'a' හි සඳහන් ඇමයිනෝ අම්ල සඳහා උදාහරණ දෙකක් ලියන්න.

.............................................................................................................

.............................................................................................................

II. කුඩා අන්ත්‍රයේ අපිච්ඡදය හරහා පහත සඳහන් පෝෂක පරිවහනය වන ක්‍රම සඳහන් කරන්න.

| පෝෂකය | පරිවහනය වන ක්‍රමය |
|---|---|
| a) ෆෲක්ටෝස් | .................................................. |
| b) ඇමයිනෝ අම්ල | .................................................. |
| c) ජලය | .................................................. |

III. (a) විටමින යනු මොනවාද?

.............................................................................................................

(b) තේ වල අඩංගු වන විටමිනයක් හා ඛනිජයක් ලියන්න.

විටමිනය - ..................................................................................

ඛනිජය - ..................................................................................

IV. (a) රුධිරයේ ස්වාරක්ෂණය සඳහා වැදගත් වන ද්‍රව්‍ය සඳහන් කරන්න.

.............................................................................................................

(b) සායනික කටයුතු වලදී රුධිර ප්‍රතිකැටිකාරකයක් ලෙස බහුලව භාවිතා වන ද්‍රව්‍යයක් ලියන්න.

.............................................................................................................

(B) I. (a) ප්‍රදාහක ප්‍රතිචාරය ඉහල නැංවීම සඳහා හේතුවන ප්‍රති ක්ෂුද්‍ර ජීවී ප්‍රෝටීනයක් සඳහන් කරන්න.

.............................................................................................................

(b) T හා B වසා සෛල මගින් ප්‍රතිදේහ ජනකයක් හඳුනා ගන්නේ කෙසේද?

.............................................................................................................

